**ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුලි 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුලි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) මෙම වාර්තාවේ 1.6.2 (අ), (ආ) ඡේදවල සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කළ නිර්දේශයන් සමාලෝචිත වර්ෂය තුළදීත් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

#### (අ) තැන්පතු ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ගිණුම්ක ලැබීම්වල රු. 652,148 ක වෙනසක් නිරීක්ෂණය විය. මේ පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා පත් කර ඇති කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් 2019 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමෙන් පසු ලැබුණු බවත් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලපීම් සිදු කරන බවත් පෙර වර්ෂයේ සම්පිණ්ඩන වාර්තාවට අදහස් ප්‍රකාශ කර තිබුණ ද එය අධ්‍යයනය කර අවශ්‍ය ගැලපීම් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව පොදු තැන්පත් ශේෂ සැසඳිය යුතුය. |

#### (ආ) වෙනත් ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් කාර්යාල 03 ක් විසින් යන්ත්‍ර කුලියට දීමෙන් ලබා ගත් සහ භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ලබා ගත් රු. 2,151,773 ක මුදල වෙනත් ලැබීම් ලෙස සමාලෝචිත වර්ෂයේ ගිණුමට ඇතුළත් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | මෙම වටිනාකමට අදාළ තොරතුරු නිවැරදිව හඳුනා ගැනීමෙන් අනතුරුව නිසි පරිදි රජයේ ආදායමට බැර කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | වර්ෂයේ ලැබීම් සියල්ලම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

#### දේපළ පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව යටතේ පවතින ගොවිජන සේවා මධ්‍යස්ථාන 520 ක, යාන්ත්‍රික අංගන 05 ක සහ ප්‍රධාන කාර්යාලයේ ඉඩම්, මූල්‍ය නොවන වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | දෙපාර්තමේන්තුවට අයත් සියලු ඉඩම් ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුව සතු ගොවිජන සේවා මධ්‍යස්ථාන 408 ක, යාන්ත්‍රික අංගන 03 ක හා ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි 03 ක ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | ප්‍රධාන කාර්යාලයේ සහ මධ්‍යස්ථාන 9 ක ගොඩනැගිලි සැලැස්මෙහි පිටපත් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර මේ වන තෙක් තක්සේරු වටිනාකම් ලැබී ඇති අතර අනෙකුත් ගොඩනැගිලිද තක්සේරු කර ඉදිරියේදී CIGAS වැඩසටහනට ඇතුළත් කරනු ලබන බව දන්වා සිටිමි. | දෙපාර්තමේන්තුවට අයත් සියලු ගොඩනැගිලි ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | පෙර වර්ෂයේදී රු. 26,969,617 ක් වැය කර මිලදී ගත් ජල කළමනාකරණ උපකරණ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | මෙම උපකරණ වර්ෂය තුළදී ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර අවසන් කරනු ලබන බව දන්වා සිටිමි. | මූල්‍ය නොවන වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී අනුරාධපුරය කලංකුට්ටිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ රු. 9,200,516 ක් වැය කර ඉදිකර තිබුණු ගොඩනැගිල්ල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගොඩනැගිලි හා ඉදිකිරීම් යටතේ දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | ස්ථාවර වත්කම් ලේඛනය සඳහා මෙම වර්ෂයේ සිට ආරම්භක ශේෂයක් ලෙස ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | සියලු ඉදිකිරීම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී රු. 74,658,092 ක් වැය කර මිලදී ගත් ජල උස මාපක 3,000 ක්, පරිලෝකන යන්ත්‍රයක්, වර්ෂාපතනමාන කට්ටල 20 ක්, අධි තාක්ෂණික මිනුම් උපකරණ 98 ක්, මීටර් 90 ක්, ජල ප්‍රමිතිය මැනීමේ උපකරණයක් සහ මෘදුකාංග පද්ධතියක්, ආරක්ෂිත කැමරා පද්ධතියක්, පරිගණක මොනිටර් 04 ක් සහ ඡායා පිටපත් යන්ත්‍රයක් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | එම උපකරණ මෙම වර්ෂයේදී ආරම්භක ශේෂ ලෙස CIGAS වැඩසටහන මඟින් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | මූල්‍ය නොවන වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත්කරනු ලබන "සම්පත් පැතිකඩ" නම් ප්‍රකාශනයේ දැක්වෙන දෙපාර්තමේන්තුව සතු පොහොර ගබඩා 519 ක්, සංචාරක බංගලා 06 ක්, නිල නිවාස 152 ක් සහ බොජුන්හල් 20 ක වටිනාකම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කරනු ලබන බව දන්වා සිටිමි. | දෙපාර්තමේන්තුවට අයත් සියලු ගොඩනැගිලි ගිණුම්ගත කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂයේ රු. 4,225,373 කට මිහින්තලයේ සංචාරක නිවාසයට මිලදී ගත් ගෘහ භාණ්ඩ හා ප්‍රධාන කාර්යාලය සඳහා මිලදී ගත් කාර්යාල උපකරණ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | එම උපකරණ සඳහා මේ වන තෙක් ගෙවීම් කර නොමැති අතර ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර අවසන් කරනු ලබන බව දන්වා සිටිමි. | 2020 දෙසැම්බර් 31 දින වන විට සියලුම ගෙවීම් නිමකර තිබූ නිසා මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය |
| (ඌ) | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට සිවිමහල් දිගුවක් එක් කිරීම සඳහා වැයකරන ලද රු. 61,980,493 කමුදල මූලධන වත්කම් අත්පත් කර ගැනීම් පුනරාවර්තන සහ වැඩිදියුණු කිරීම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. ඒ හේතුවෙන් මෙම මුදල මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | පුනරාවර්තන සහ වැඩිදියුණු කිරීම් සඳහා ලැබෙන ප්‍රතිපාදන අදාළ වැය ශිර්ෂය වෙනුවෙන් වැය කළ යුතුය. |

1.6.3 **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------------------ | ---------- |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී අත්තිකාරම් අයකර ගැනීම හා අත්තිකාරම් ගෙවීම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ පෙන්විය යුතු වුවත් එය මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ තැන්පතු ලැබීම් හා ගෙවීම් සමඟ එකතු කර දක්වා තිබුණි. | මෙම වරද 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී තැන්පතු ලැබීම් හා ගෙවීම් නිවැරදිව සටහන් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර කුලියට දීමෙන් සහ භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ලද රු. 2,151,773 ක ආදායමක් පොදු තැන්පත් ලැබීමක් ලෙස ගිණුම් තැබීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තැන්පතු ලැබීම් එම අගයෙන් වැඩියෙන්ද, ආදායම් ලැබීම් එම අගයෙන් අඩුවෙන්ද දැක්වුණි. | මෙම වටිනාකමට අදාළ තොරතුරු නිවැරදිව හඳුනා ගැනීමෙන් අනතුරුව නිසි පරිදි රජයේ ආදායමට බැර කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කළයුතුය. |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රෙ. 891(i) ප්‍රකාරව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් වෙනුවෙන් ඇප ලේඛන පවත්වා නොතිබුණි. | දිස්ත්‍රික් කාර්යාලවල ඇප ලේඛනය ඒ ඒ දිස්ත්‍රික් කාර්යාල විසින් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | සියලුම ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැන්පත් කළ යුතුය. |
| (ආ) | මු.රෙ. 1645 ප්‍රකාරව වාහන ලොග් පොත් පවත්වා නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මු.රෙ. 1645 ප්‍රකාරව කටයුතු කළ යුතුය |

**1.6.5 විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහන අලුත්වැඩියා සහ අනතුරු ලිපිගොනු 20 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | විගණනට අවශ්‍ය සියලු තොරතුරු, ලිපිගොනු හා සාක්ෂි ලබා දිය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **පුනරාවර්තන වියදම්**<br>වැය විෂයයන් 01 ක ප්‍රතිපාදන රු. 100,000 ක් මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණද එම මාරු කිරීම් සියයට සියයක්ම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. තවද එක් වැය විෂයයක රු. 30,000,000 ක් මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණද එයින් සියයට 83 ක් ඉතිරි වී තිබුණි. | දේපළ ණය ඉල්ලුම් කරන ලද නිලධාරීන් වෙනුවෙන් ගෙවීමට සිදුවෙතැයි පුරෝකථනය කළ පොලී මුදල වෙනුවෙන් මු.රෙ.66 මඟින් ප්‍රතිපාදන සලසා ගන්නා ලද නමුත්, COVID වසංගත තත්වය හේතුවෙන් බැංකු විසින් ණය මුදල් ලබා දීම ප්‍රමාද වීම හා නිලධාරීන්ට ණය ලබා ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට නොහැකි වීම නිසා මෙම ප්‍රතිපාදන | සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ප්‍රමාණය ඉතිරි විය. වර්ෂ ගණනාවක සිට ගෙවීමට නොහැකි වූ හිඟ වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන මු.රෙ. 66 මඟින් ලබා ගන්නා ලද නමුත් වර්ෂය අවසානයේ දී ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හේතුවෙන් ගෙවීම් සිදු කිරීමට නොහැකි විය. මෙම හිඟ වැටුප් ප්‍රමාණයන් 2021 වර්ෂයේද ගෙවීමට නොහැකිව ඉතිරිව ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | |

(ආ) **භාණ්ඩාගාර අග්‍රිම ලැබීම්**

| | | |
|---|---|---|
| ලෝක ආහාර වැඩසටහන යටතේ සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ගෙවීම් සඳහා 2020 දෙසැම්බර් 29 දිනැති දෙපාර්තමේන්තු ඉල්ලීම මත 2020 දෙසැම්බර් 31 දින භාණ්ඩාගාරයෙන් රු. 25,916,619 ක අක් මුදලක් ලැබී තිබුණු මුත් ගෙවීම් වවුචර්වල අඩුපාඩු පැවති බව දක්වමින් ගෙවීම් නොකර එම මුළු මුදලම භාණ්ඩාගාරයට ආපසු යවා තිබුණි | අවසන් ගෙවීම් සිදු කිරීමට පෙර දිස්ත්‍රික් ව්‍යාපෘති භාර පරීක්ෂකවරුන් විසින් පෙන්වා දුන් අඩුපාඩු කිහිපයක් හේතුවෙන් ගෙවීම් අත්හිටු වීමට සිදුවිය. එබැවින් භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුමෙන් ලබා ගත් විදේශ ආධාර මුදල එම ගිණුමේම තැන්පත් කිරීමට කටයුතු කරන ලද බව කාරුණිකව දන්වා සිටිමි. | වර්ෂයට අදාළව භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන සියල්ලම උපයෝජනය කළ යුතුයි. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

බැරකම් හා බැඳීම්වලට අදාළව අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රෙ. 94(1) ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තු මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් මූලධන වැය විෂයයන් 03 ක ඉතිරි වීම් ඉක්මවා රු. 1,390,244 ක බැරකම්වලට එළඹී තිබුණු බව නිරීක්ෂණය විය. | මූලික ප්‍රතිපාදනය පදනම් කර ගනිමින් එළඹෙන ලද බැඳීම් වෙනුවෙන් අතුරු සම්මත ගිණුම් මඟින් ප්‍රතිපාදන නොලැබුණි. එබැවින් සත්‍ය වශයෙන් එළඹෙන ලද බැඳීම් වෙනුවෙන් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවුණ බව කාරුණිකව දන්වා සිටිමි. | ඉතිරි වීම් ඉක්මවා වියදමකට හෝ බැඳීමකට නොඑළඹිය යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 වර්ෂය තුළදී වැය විෂයයන් 02 ක මූලධන සහ පුනරාවර්තන ප්‍රතිපාදන ඉතිරිවීම් පිළිවෙළින් රු. 254,728,219 ක් සහ රු. 55,510,999 ක් වූ නමුත් භාණ්ඩාගාරයේ අක් මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීම නිසා රු. 196,325,746 ක බැඳීම් හා බැරකම් ඇතිවී තිබුණි. | අදහස් දක්වා නොමැත | අක් මුදල් ප්‍රමාණවත් පරිදි ලබා ගැනීමට හැකි තරම් උත්සාහ කළ යුතුය. |
| (ඇ) | 281-2-2-8-2104 දරන වැය විෂයය යටතේ පුත්තලම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පොහොර ගබඩා ඉදි කිරීමට අදාළව රු.1,111,625 ක බැඳීම් මුදලක් ඇති බව වාර්ෂික ප්‍රගති වාර්තාවේ දැක්වූවද මූල්‍ය ප්‍රකාශනවල එය රු. 1,353,009 ක් ලෙස දැක්වීම නිසා බැඳීම් රු. 241,384 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත | වෙනස්කම් ගැලපීම් කළ යුතුය. |
| (ඈ) | කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව වැය විෂයය අංක 281-2-2-0-2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ තිබුණු රු. 1,797,029 ක බැඳීම් වටිනාකම සටහන iii හිදක්වා නොතිබීම හේතුවෙන් බැඳීම් වටිනාකම එම ප්‍රතිසංස්කරණ අඩුවෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත | බැඳීම් හා බැරකම් නිසි පරිදි ගිණුම්ගත යුතුය. |
| (ඉ) | 2020 වර්ෂය තුළදී ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් වැය විෂයයන් 25 ක රු. 36,919,972 ක බැඳීම් හා බැරකම් ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | බැරකම් නිසි පරිදි ගිණුම්ගත යුතුය. |

**2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවි භාර අරමුදලින් ගොවි බැංකු ගොඩනැගිලි 06 ක් ඉදිකිරීම සඳහා රු. 22,800,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ඉන් රු. 5,980,000 ක් වැයකර ගොඩනැගිලි 04 ක වැඩ ආරම්භ කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්මට අනුව එම ඉදිකිරීම් 2020 මාර්තු 31 දින වන විට අවසන් කළ යුතුව තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | නියමිත දිනට වැඩ අවසන් කළ යුතුය. |
| (ආ) | **හෙළ සුවය නියමු ව්‍යාපෘතිය**<br>2020 වර්ෂයේදී වස විසෙන් තොර පාරම්පරික වී ප්‍රභේද යොදා ගනිමින් අක්කර 10,000 ක වගාකර වී කිලෝ ග්‍රෑම් 18,000,000 ක් අස්වැන්නන් ලබා ගැනීම අරමුණු ඇතිව මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය විසින් අංක 118-2-3-20-2509 දරන වැය විෂයය යටතේ බිත්තර වී මිලදී ගැනීමට සහ අංක 118-2-4-1405 දරන වැය විෂයය යටතේ ඖෂධීය දියර පොහොර ලබා ගැනීමට රු. 82,600,000 ක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ රාජාංගනය වම් ඉවුර ගොවිජන සේවා මධ්‍යස්ථානයට ලබා දී තිබුණි. එයට අදාළව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.<br><br>(i) එම ප්‍රතිපාදන උපයෝගී කරගෙන කුඹුරු අක්කර 3,152 ක් වගාකර වී කිලෝ ග්‍රෑම් 1,974,350 ක අස්වැන්නක් ලබාගෙන තිබූ අතර එය අපේක්ෂිත අස්වැන්නෙන් සියයට 11 ක ප්‍රමාණයක් බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති මනාව සැලසුම් කිරීම සහ අධීක්ෂණය සිදු කළ යුතුය. |

(ii) ඉහත වගාව සඳහා බිත්තර වී කිලෝ ග්‍රෑම් 181,641 ක් මිලදී ගෙන තිබුණු අතර එයින් 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට නොගත් බිත්තර වී කිලෝ ග්‍රෑම් 57,865 ක් පැවති බව නිරීක්ෂණය විය. තවද "හෙළ සුවය" නම් පෞද්ගලික ආයතනයකින් ඖෂධ දියර පොහොර ලීටර් 18,056 ක් ලබාගෙන තිබූ අතර ඒ වෙනුවෙන් එම ආයතනයට රු. 18,500,000 ක් ගෙවිය යුතුව ඇති බව අදාළ ආයතනය දක්වා තිබුණද එහි නිවැරදිතාවය නිශ්චය කිරීමට දෙපාර්තමේන්තුව සතුව ලිඛිත සාක්ෂි නොවීය.

**2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2004 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 118 ප්‍රකාරව ස්ථාන මාරුවී පැමිණි හා ගිය නිලධාරීන්ගේ ණය ශේෂ මාස 03 ක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත් 2020 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී පැමිණි හා ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂය පිළිවෙලින් රු. 117,616 ක් සහ රු. 1,683,639 ක් විය. | අදහස් දක්වා නොමැත | 2004 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 118 ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ආ) | වැඩ තහනම් කළ, සේවය හැර ගිය, මිය ගිය, විශ්‍රාම ගිය සහ වෙනත් ණය ශේෂවල 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු. 18,345,493 ක් වූ අතර එයින් වර්ෂ 05 කට වැඩි ශේෂය රු. 8,267,272 ක් විය. | අදහස් දක්වා නොමැත | ඇපකරුවන්ගෙන්, විශ්‍රාම වැටුපෙන්, විනය ක්‍රියාමාර්ග මගින් වගකීම පැහැර හැරි අයගෙන් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් අනුගමනය කර අයකර ගැනීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | පළාත් සභා සඳහා මාරු වී ගිය නිලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු. 1,083,808 ක් වූ අතර එයින් වර්ෂ 05 ක කාලය ඉක්ම වූ ණය ශේෂය රු. 722,730 ක් විය. | අදහස් දක්වා නොමැත | ණය ශේෂ අප්‍රමාදව නිරවුල් කරගත යුතුය. |

## 2.5 තැන්පතු

---------

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්‍රාම ගිය රජයේ නිලධාරීන්ගෙන් අයකර ගත් රු. 262,519 ක සේවක ණය ශේෂය ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට නොයවා ප්‍රධාන කාර්යාලයේ පොදු තැන්පතුවල රඳවාගෙන තිබුණි. | ඉදිරියේදී මෙම ශේෂ වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමෙන් අනතුරුව දිස්ත්‍රික් කාර්යාල වෙත නිරවුල් කිරීම සඳහා අදාළ අංශ දැනුවත් කරන ලදී | ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අදාළ මුදල් නොපමාව ගෙවිය යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් කාර්යාල 06 ක කොන්ත්‍රාත් රැඳවුම් රු. 12,481,081 ක් වර්ෂ 02 සිට 05 දක්වා කාලයක සිට පැවත එන අතර අදාළ කොන්ත්‍රාත්වල පැවති අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන හෝ සකස් නොකරන්නේ නම් එම රැඳවුම් මුදල උපයෝජනය කර එම අඩුපාඩු සම්පූර්ණ කර අදාළ රැඳවුම් මුදල් නිරවුල් කිරීමට 2020 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්මවූ කොන්ත්‍රාත් රැඳවුම් තැන්පතු වලින් මේ වන විට රු. මිලි. 04 ක් සඳහා රික්විෂන් පත්‍ර ඉදිරිපත් වී ඇති නමුත් අක් මුදල් ප්‍රමාණවත් නොවීමෙන් ගෙවීම් ප්‍රමාද වී ඇති අතර ඉතිරි රැඳවුම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | කොන්ත්‍රාත් ගෙවීම්වල අඩුපාඩු සම්පූර්ණ කර ඉතිරි මුදල් අප්‍රමාදව ගෙවීම් කළ යුතුය. |
| (ඇ) | කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයේ 2019 වර්ෂයේදී භාණ්ඩ වෙන්දේසියක් සිදුකර ලබාගත් රු. 5,452,750 ක මුදල ප්‍රධාන කාර්යාලයට නොඑවා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ට්‍රැක්ටර් හා උපාංග වෙන්දේසි කිරීමෙන් ලද මුදල් සඳහා රික්විෂන් පත්‍ර ඉදිරිපත් වී ඇති නමුත් අක් මුදල් ප්‍රමාණවත් නොවීමෙන් ගෙවීමේ ප්‍රමාද වී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | අපහරණ ආදායම රාජ්‍ය ආදායමට බැර කළ යුතුය. |
| (ඈ) | දිස්ත්‍රික් කාර්යාල 03 ක ව්‍යාපෘතිවල අඩුපාඩු ඇති බැවින් පොදු තැන්පත් ගිණුම්වල රු. 1,117,847 ක රැඳවුම් මුදලක් වර්ෂ 02 කට වඩා වැඩි කාලයක සිට පැවත එන අතර එම කොන්ත්‍රාත්වල අඩුපාඩු සකස් කර රඳවා ගැනීමේ මුදල් ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි | අදාළ ව්‍යාපෘති වල පසු කාලීනව ඇති වූ ඌනතා දැනට යථාවත් කරමින් පවතින බැවින් ඒ සඳහා වැය වූ මුදල ගණනය කිරීමෙන් පසුව රැඳවුම් මුදලින් අයවිය යුතු මුදල තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඉතිරි රැඳවුම් මුදල නිදහස් කිරීමට කටයුතු කරන බව දිස්ත්‍රික් කාර්යාල විසින් දන්වා එවා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | කොන්ත්‍රාත් අඩුපාඩු රැඳවුම් මුදලින් සිදුකර ඉතිරි මුදල් හිමිකම් නොපාන බව තහවුරු කරගෙන රාජ්‍ය ආදායමට බැර කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඉ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම නිරවුල් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයකර ගත් රු. 386,132 මුදල අදාළ ණය ශේෂ නිරවුල් නොකර රජයේ ආදායමට බැර කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | මෙම මුදල අදාළ නිලධාරියාගේ අත්තිකාරම් ණය ශේෂයට ගැලපිය යුතුය. |
| (ඊ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් එකතු කළ අක්කර බදු දිස්ත්‍රික් කාර්යාලයට එවීමෙන් අනතුරුව ගොවිජන සංවර්ධන අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් 2020 වර්ෂයේ දිස්ත්‍රික් කාර්යාල 06 ක් විසින් එකතු කරනු ලැබූ රු. 2,916,607 අක්කර බදු ආදායම ගොවිජන සංවර්ධන අරමුදලට ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | අදාල අක්කර බදු මුදල් කඩිනමින් ප්‍රධාන කාර්යාලය වෙත එවන මෙන් දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි | ගොවිජන සංවර්ධන අරමුදලට අයත් ආදායම් එම අරමුදලට බැර කළ යුතුය |
| (උ) | දිස්ත්‍රික් කාර්යාල 05 ක ටෙන්ඩර් තැන්පත් වලින් ආපසු මුදල් ලබාගැනීම සඳහා රික්විෂන් ඉදිරිපත් වී තිබියදීත් අක් මුදල් නොමැති වීම නිසා නොගෙවූ තැන්පත් මුදල රු. 5,524,474 ක් විය. | 2020 හා 2021 වර්ෂවල පොදු තැන්පතු නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් අක් මුදල් ඉල්ලීමක් ලැබී නොතිබුණි. අක් මුදල් ලද වහාම පොදු තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි. | අක් මුදල් ලබා ගෙන නිරවුල් කළ යුතුය. |
| (ඌ) | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සියයට 50 දායකයක් අයකර ගැනීමේ පදනම යටතේ ගොවීන් වෙත බෙදා දී තිබූ කෘෂි උපකරණ වෙනුවෙන් මොනරාගල ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් 2019 හා 2020 වර්ෂවලදී අය කළ රු. 1,132,000 ක මුදල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ඉතිරිය නිරවුල් කිරීම සඳහා රික්විෂන්පත්‍ර ඉදිරිපත් වී ඇති නමුත් අක්මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් නිරවුල් කිරීමට නොහැකිව පවතින අතර අක්මුදල් ලද වහාම නිරවුල් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | අදාළ මුදල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රේෂණය කළ යුතුය. |
| (එ) | දිස්ත්‍රික් කාර්යාල 04 ක් සඳහා ලබා දී තිබූ පොහොර සහනාධාර මුදලින් ඉතිරි වූ රු. 6,567,560 ක් වූ මුදල ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | පොහොර සහනාධාර යටතේ ලද මුදල් ප්‍රධාන කාර්යාලයට එවීමකින් තොරව දිස්ත්‍රික් කාර්යාල විසින්ම රජයේ ආදායමට බැර කර නිරවුල් කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාල වෙත උපදෙස් ලබා දී ඇති අතර ඒ අනුව කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | නොපමාව නිසි පරිදි නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | අම්පාර දිස්ත්‍රික් කාර්යාලය 2018 වර්ෂයේදී පැරණි කෘෂි යන්ත්‍ර වෙන්දේසි කිරීමෙන් ලබාගත් අපහරණ ආදායම වූ රු. 1,967,600 ක මුදල ගොවිජන සංවර්ධන අරමුදලට බැර කළ යුතු වුවත් එසේ නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | මෙම කෘෂි යන්ත්‍ර වෙන්දේසි කිරීමෙන් ලබා ගත් අපහරණ ආදායම බැර කළ යුතු වන්නේ ගොවිජන සංවර්ධන අරමුදලටද නැතහොත් රාජ්‍ය ආදායමට ද යන්න විමසා බලමින් සිටින අතර එය අවසන් වූ වහාම නිරවුල් කිරීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි. | ගොවිජන සංවර්ධන අරමුදලට බැර කළ යුතුය. |
| (ඔ) | අම්පාර දිස්ත්‍රික් කාර්යාලයට රබර් පැළ නැවත වගා කිරීම වෙනුවෙන් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු රු. 1,097,292 ක මුදල අදාළ කාර්යයට නොයොදවා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | අදාළ ව්‍යාපෘතියේ අවසාන බිල්පත මේ වන විට සකස් කරමින් පවතින අතර එය ලද වහාම බිල්පත ගෙවා නිරවුල් කිරීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි. | වෙතත් ආයතන වලින් ලැබුණු මුදල් අදාළ කාර්යයට යෙදවිය යුතුය |
| (ඕ) | කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයට 2019 වර්ෂයේදී රස්නායකපුර කණුකැටිය මුඩුත්තව වැව සංවර්ධනය කිරීම සඳහා ලබාදී තිබුණු රු. 402,225 ක මුදල ඉදිකිරීම සඳහා යොදා නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | අදහස් දක්වා නොමැත. | නොපමාව අදාළ කාර්යයට යොදාගත යුතුය |

## 2.6 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | ඉදිරිපත් කරන සියලු විගණන විමසුම් වෙනුවෙන් අදාළ පැහැදිලි කිරීම් දිස්ත්‍රික් කාර්යාල හා ඒ ඒ මධ්‍යස්ථාන වෙතින් ලබාගෙන පිළිතුරු ගොනු කළ යුතු නිසා පිළිතුරු සැපයීම සමහර අවස්ථාවලදී ප්‍රමාද වීම් දක්නට ලැබේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඉ) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි | අදහස් දක්වා නැත | එම |
| (ඇ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳ සමාලෝචනය ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | අදහස් දක්වා නැත | එම |

**2.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව**<br>---------------- | **අනුකූල නොවීම**<br>------------------- | ----------------- | ------------------ |
| (අ) | **2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් (සංශෝධිත) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත**<br>------------------ | | | |
| | 51(1) වගන්තිය | ගොවිජන සංවර්ධන සභා පිහිටුවා නොතිබුණි. | දැනට නියෝග සකසා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.එය ලැබුණු පසු නියෝග ගැසට් පත් නිකුත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| **(ආ)** | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනත හා 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත | එල්ලංගා ව්‍යාපෘතියට අනුයුක්ත තාවකාලික නිලධාරීන්ගේ වැටුපෙන් අඩුකරනු ලබන සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා වූ වාරික මුදල වන රු. 1,585,415 ක් ශ්‍රී ලංකා මහ බැංකුවට හා කම්කරු දෙපාර්තමේන්තුවට නොගෙවා ප්‍රධාන කාර්යාලයේ පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. පෙර වර්ෂයේදී ද මේ පිළිබඳ වාර්තා කළද අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>------------------- | | | |
| (i) | මු.රෙ. 571 | වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු ගිණුම්වල අවසාන ශේෂය නියාදනය කළ යුතු වුවත් පොදු තැන්පත් ගිණුම් 04 ක 2020 දෙසැම්බර් 31 දිනට වසර 02 ක් ඉක්මවූ තැන්පතු එකතුව රු. 64,853,898 සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මු.රෙ. 104(1)(අ) | පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවත් වාහන 03 ක අනතුරු සම්බන්ධයෙන් වගකිව යුත්තන් නිශ්චය කිරීමට පරීක්ෂණ ආරම්භ කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | මු.රෙ. 1645(ආ) | එක් එක් වාහනයේ රියදුරා ලවා 268 වැනි පොදු ආකෘතියේ දෛනික ධාවන සටහනක් තබා ගැනීමට සලස්වා පරිපාලන නිලධාරීන් ලවා එය නිතිපතා | අදහස් දක්වා නොමැත | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පරීක්ෂා කිරීම කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ වාහන 14 ක් සඳහා දෛනික ධාවන සටහන් රියදුරන් විසින් ලියා සම්පූර්ණ කර නොතිබුණි. | | |
| **(iv)** | මු.රෙ. 1646 | 265(අ) වැනි පොදු ආකෘතියේ ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද වාහන 14 ක එසේ සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (v) | මු.රෙ. 1647(ඉ) | වාහන භාර නිලධාරී විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳ ඒ ඒ වාහනයේ වර්ගය හා මෝස්තරයද ලියාපදිංචි කිරීමේ අංකයද, තමන්ට භාරදුන් දිනයද, පැවරූ දිනයද පිළිබඳ විස්තර වෙනත් තොරතුරු දැක්වෙන ලැයිස්තුවක් තබාගත යුතු වුවත් එසේ කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** ------------------ | | | |
| (i) | **2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016** | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝ මීටර් 25,000 ක ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණය අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවකට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් සිදු කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ වාහන 137 ක් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2018 ජනවාරි 24 දිනැති 05/2018(i) අංක දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (iii) | 2018 ජනවාරි 24 දිනැති 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | **රාජ්‍ය මුදල් චක්‍රලේඛය**<br>------------------ | | | |
| (i) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මු.රෙ. 770 (4)(ආ) | විශේෂ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශය අනුව, 2015 වර්ෂයේ අපහරණය කළ යුතු යන්ත්‍ර 02 ක්, 2018 වර්ෂයේ අපහරණය කළ යුතු යන්ත්‍ර 07 ක් සහ 2019 වර්ෂයේ අපහරණය කළ යුතු වාහන 26 ක් 2021 මාර්තු 31 දින දක්වා අපහරණය කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | චක්‍රලේඛය උපදෙස් පරිදි අපහරණ කමිටුව පත් කළ යුතුය. |
| (ii) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.1 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 හි 2 වගන්තිය | මූල්‍ය ප්‍රකාශන භාෂාත්‍රයෙන් ඉදිරිපත් කළ යුතු වුවද එසේ කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| **(ඊ)** | 2018 මැයි 10 දිනැති අංක 265/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | 2018 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ කරන කාලපරිච්ඡේද ආවරණය කරමින් පිළියෙල කරන වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් බලාත්මක බව දක්වා තිබුණද දෙපාර්තමේන්තුව විසින් ගොවිජන සේවා මධ්‍යස්ථානවල | ආදායම් සහ වියදම් නිවැරදිව හඳුනා ගැනීමට මෙන් ම ගොවිජන සේවා කාරක සභාවල/ සංවර්ධන සභාවල මූල්‍යප්‍රකාශන සකස් කිරීමට අදාළව ඉදිරියේ දී සකස් කිරීමට අපේක්ෂිත පරිගණකගත මෘදුකාංගය සකස් කිරීමේ පහසුව පිණිස ගොවිජන | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාරව ගොවිජන සේවා මධ්‍යස්ථානවල ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා එම චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන ලෙස වාර්තාව පෙළ ගැස්වීම, අයවැය දත්ත ඉදිරිපත් කිරීම, පූර්ව කාලපරිච්ඡේද ගැලපීම යනාදිය අඩංගු ලිපියක් නිකුත් කර තිබුණි. | සංවර්ධන කාරක සභාවල/ සංවර්ධන සභාවල හඳුනාගෙන ඇති සියලුම ආදායම් සහ වියදම් සඳහා ශීර්ෂ අංක හඳුන්වා දී ඇත. එය රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ වලට අනුකූලව ඉදිරිපත් කර ඇත. | |
| (උ) | 2019 ඔක්තෝබර් 10 දිනැති 3/2019 අංක දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ චක්‍රලේඛයේ 05 ඡේදයේ xv වගන්තිය | කොන්ත්‍රාත් පදනම මත උපරිම සේවා කාලය වර්ෂයක් පමණක් විය යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් දිගින් දිගටම සේවා බණ්ඩනයකින් තොරව නියෝජ්‍ය කොමසාරිස්, සහකාර කොමසාරිස්, ඉංජිනේරු, පරිපාලන නිලධාරී වැනි නිලධාරීන් 18 කට සේවා දිගු ලබාදීම සිදුකර තිබුණි. | අදහස් දක්වා නොමැත | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඌ)<br>(i) | **දෙපාර්තමේන්තු චක්‍රලේඛය**<br>**------------------**<br>ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 1981 ඔක්තෝබර් 16 දිනැති 107 චක්‍රලේඛයේ 30(iii) වගන්තිය | 2016, 2017, 2018 සහ 2019 වර්ෂවලට අදාළව ගොවිජන සේවා කාරක සභාවල මූල්‍ය ප්‍රකාශන 09 ක් හා 2020 වර්ෂයට අදාළව ගොවිජන සේවා කාරක සභා මූල්‍ය ප්‍රකාශන 544 ක්ද නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි | අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල, පානම යන ගොවිජන සේවා මධ්‍යස්ථාන 02 ට අදාළ මූල්‍ය ප්‍රකාශන පමණක් හිග මූල්‍ය ප්‍රකාශන ලෙස සඳහන් කිරීම නිවැරදි වේ. 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළව දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදෙන ලද නව ආකෘති පත්‍රවලට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සිදු කරන බැවින් 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පසුගිය වසරට සාපේක්ෂව අඩු මට්ටමක පවතී. | දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | කොමසාරිස් ජනරාල්ගේ 2018 දෙසැම්බර් 28 දිනැති අංක "7/6/4/1 ධාවන සටහන්" දරන උපදෙස් ලිපිය | අදාළ මාසයේ දෛනික ධාවන සටහන් ලබා දී ඇති බවට විෂයභාර නිලධාරීන්ගේ සහතිකය මත පමණක් අතිකාල ගෙවිය යුතු වුවත් දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකළ රියදුරන් 17 ක් සඳහා රු. 3,264,231 ක මුදලක් අතිකාල වශයෙන් ගෙවීම් කර තිබුණි. | අදහස් දක්වා නොමැත | කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් ලිපිය අනුව කටයුතු කළ යුතුය. |

## 2.8 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල 17 ක් විසින් දිස්ත්‍රික්කවලට අයත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 339 කින් එකතුව රු. 76,350,549 ක මුදලක් නැවත ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ලබාගෙන තිබුණි. ඇතැම් ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් රු. 3,520,000 ක් වැනි විශාල මුදල් ප්‍රමාණයක් ලබාගෙන ඇති බව නිරීක්ෂණය විය. 2019 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල් පියවා නොතිබුණු අතර එදිනට බැරකම්වලටද ඇතුළත් කරනොතිබුණි. | අදහස් දක්වා නොමැත | ගොවිජන සේවා කාරක සභා පනත යටතේ පිහිටවූ ස්වාධීන ආයතනයක් වන බැවින් දිස්ත්‍රික් කාර්යාල විසින් ලබාගත් රු. 76,350,549 ක මුදල ආපසු එම ගොවිජන සේවා මධ්‍යස්ථානවලට ප්‍රතිපූර්ණය කළ යුතුය. |

## 2.9 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තත්කාර්ය අතුරු අග්‍රිම ලබාගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් කාර්යය නිම කළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 30 ක් වෙත අවස්ථා 175 කදී ලබාදී තිබුණුරු. 2,544,314 ක අත්තිකාරම් මුදල් පියවීම සඳහා දින 22 සිට දින 352 දක්වා කාලයක් ගත වී තිබුණි. | රටේ පැවති COVID-19 හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් සාමාන්‍ය රාජකාරී කටයුතු අඩාල වීම නිසා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව නිශ්චිත කාර්යයන් නිශ්චිත කාල වකවානුව තුළ ඉටු කිරීමට නොහැකි වීම නිසා මෙම තත්ත්වය ඇති වූ බව කාරුණිකව දන්වමි. | තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම කර නියමිත කාලය තුළදී පියවාගත යුතුය. |

**2.10** **බැංකු ගිණුම් මෙහෙයවීම**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුමේ ඇතුළත්ව තිබුණු රු. 7,997,356 ක් වටිනාකමැති චෙක්පත් 251 ක් සම්බන්ධයෙන් මු.රෙ. 396 (ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | දිස්ත්‍රික් කාර්යාල වල ඇති චෙක්පත් නිරවුල් කිරීමට මු.රෙ. 396(ඈ) ප්‍රකාරව කටයුතු කරන ලෙස දැනුවත් කර ඇත. ප්‍රධාන කාර්යාලයේ ඇති චෙක්පත් සඳහා ලිපි හා සිහි කැඳවීම් යොමු කර ඇති අතර හානි බැඳුම්කර ලද චෙක්පත් සඳහා නව චෙක්පත් නිකුත් කිරීමටත් අනෙකුත් චෙක්පත් රජයේ ආදායමට බැර කිරීමටත් කටයුතු කර ඇත. | මු.රෙ. ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ආ) | එක් දිස්ත්‍රික් කාර්යාලයක බැංකු සැසඳුමෙහි හඳුනා නොගත් රු. 63,775 ක ගෙවීම් තිබුණු අතර ඒවා හඳුනාගෙන මුදල් පොතට ගැලපීම් කර නොතිබුණි. | පසුගිය සමයේ පැවති යුධ කටයුතු හේතුවෙන් කිළිනොච්චි දිස්ත්‍රික් කාර්යාලයේ සියලු පොත් පත් විනාශ වී තිබුණි. 2009 අප්‍රේල් මස කිළිනොච්චිය ලංකා බැංකුව මඟින් ලබා දුන් බැංකු ප්‍රකාශයට අනුව ගනුදෙනු සිදු කළ අතර නැවත 2009 මැයි මස බැංකු ප්‍රකාශයෙන් ලංකා බැංකුව නව බැංකු ප්‍රකාශයක් නිකුත් කරන ලදි. එහි හඳුනා නොගත් ගෙවීම් ලෙස රු. 63,775 ක් දක්වන ලදී. බැංකුවේ ලියකියවිලිද යුධ සමයේ විනාශ වී ඇති බැවින් මේ පිළිබඳව විස්තර බැංකුව සතුව ද නොමැති බව දක්වා ඇත. | බැංකු සැසඳුම්වල හඳුනා නොගත් ශේෂ හඳුනාගෙන මුදල් පොතට ගැලපීම් කළ යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතුව තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු. 101,985,237 ක සුළු වාරිමාර්ග ව්‍යාපෘති 29 ක් වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දින වන විට රු. 48,548,237ක් වැය කර තිබුණු මුත් එම ව්‍යාපෘති එදින වන විටත් නිමකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් කළ යුතු ඇස්තමේන්තුගත පිරිවැය රු. 6,170,000 ක් වූ පොහොර ගබඩා 02 ක් ඉදිකිරීම සඳහා රු. 2,197,669 ක වියදමක් දරා තිබුණත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ව්‍යාපෘති සැලසුම් කළ පරිදි සිදු කළ යුතුය |

## 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

-----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති 02/2020 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 3.3 විදේශ ආධාර ව්‍යාපෘති

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලෝක ආහාර වැඩසටහනේ යන්ත්‍ර හා ශ්‍රම පිරිවැය සඳහා දායකත්වයෙන් 2020 වර්ෂයේ සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 26 ක් ආරම්භ කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට ශ්‍රම හා යන්ත්‍ර පිරිවැය රු. 37,194,429 ක් දරා තිබුණි. එසේම 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2020 වර්ෂයේ ඔක්තෝබර් මස අවසන් වන විට සුළු වාරිමාර්ග කටයුතු නිම කර ගොවි සංවිධාන වෙත දිය යුතුව තිබුණි. කෙසේ වුවත් රු. 17,517,887 ක ශ්‍රම හා යන්ත්‍ර පිරිවැයක් දරන ලද ව්‍යාපෘති 17 ක් 2021 මාර්තු 31 දින වන විටත් අවසන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවීන් හට වර්ෂාව අඩු කාලවලදී වගාවන් සඳහා අවම ජල ප්‍රමාණයකින් වගා කිරීමට සහ වර්තමානයේ පවතින බලශක්ති අර්බුදයට විසඳුම් ලෙස නොමිලේ ලැබෙන සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ජල පොම්ප හා බිංදු ජල තාක්ෂණය යොදා ගැනීම සඳහා 2005 – 2008 වර්ෂවලදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත රු. 2,327,272,272 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. මෙම ප්‍රතිපාදනවලින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 19 කට සූර්යබල ජල සූක්ෂ්ම පද්ධති 7,231 ක් ලබා දී තිබුණි. මෙම පද්ධතීන් සඳහා 2018 වර්ෂය අවසන් වන විට සියලුම මුදල් අයකර අවසන් කළ යුතු වුවද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු කොමසාරිස් ජනරාල් අමතන ලද 2020 ජූලි 03 දිනැති ලිපිය අනුව වර්ෂය අවසානයට අයවිය යුතු මුදල රු. 2,264,753,696 ක් විය. 2020 වර්ෂය වන විට ලබා දී තිබුණු පද්ධතිවලින් සියයට 90 ක් අස්ථානගතව, අභාවිතව, ගොවීන්ගේ තොරතුරු සොයාගත නොහැකිව සහ අක්‍රීයව පැවති බව නිරීක්ෂණය විය. ඒ අනුව ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | මෙම පද්ධති ස්ථාපනය කර ඇත්තේ ෆෝසයිටි ඉංජිනේරියන් සමාගමේ එවකට සිටි තාක්ෂණික නිලධාරීන් විසින් වන අතර ඔවුන්ගේ ජීව දත්ත පිළිබඳ නිවැරදි තොරතුරු දිස්ත්‍රික් කාර්යාලවට ලබා දී නොමැති බව දිස්ත්‍රික් කාර්යාල දන්වා ඇත. ගිවිසුම් පත්‍රය අනුව මුදල් ගෙවීම පැහැර හැරීමකදී සූර්ය බල ජල සූක්ෂම පද්ධති අත්පත් කරගන්නා බව දන්වා තිබුණද එහිදී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය පිළිබඳ පැහැදිලි උපදෙසක් ලබාදී නොතිබීම. තවද ගිවිසුම් නොමැතිව සූර්ය බල ජල සූක්ෂම පද්ධති ලබා දී තිබීම. මූලික තැන්පත් මුදල පිළිබඳවද නිශ්චිත වටිනාකමක් සඳහන් නොවීම. ගිවිසුම් පත්‍රයේ පවතින අඩුපාඩු නිසා මුදල් නියමිත පරිදි අයකර ගැනීමේ ගැටළු මතු වී ඇත. තවද කෘෂිකර්ම අමාත්‍යාංශය හා ෆෝ සයිටි ඉංජිනේරු සමාගම සමග ආරම්භක අවස්ථාවේ සිට මනා සම්බන්ධීකරණයක් සිදුවී නොතිබීම නිසා මුදල් නියමිත පරිදි අයකර ගැනීමේ ගැටලු මතුවීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටු නොවී ඇත. | ගිවිසුම් අනුව සියලුම මුදල් කඩිනමින් අයකර අවසන් කළ යුතුය |
| (ඇ) | ඉහත (ආ) ඡේදයේ දැක්වෙන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් සහ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශ ලේකම් අතර 2007 අගෝස්තු 06 දින ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම උප ණය ගිවිසුම අනුව මාස 06 කට වරක් රු. 15,190 ක් බැගින් වාරික 20 කින් අදාළ ණය අයකර ඒවා ගොවි බැංකුවේ තැන්පත් කිරීමට සහ අය කළ ණය වාරික සහ ණය ප්‍රමාණය පිළිබඳ විස්තරාත්මක ලේඛනයක් මාසිකව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුව එකඟ වී තිබු අතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත අදාළ තොරතුරු ඉදිරිපත් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත | අය කළ ණය වාරික සහ ණය ප්‍රමාණය පිළිබඳ විස්තරාත්මක ලේඛනයක් මාසිකව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කෘෂිකර්ම අමාත්‍යාංශයේ තොරතුරු අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සූර්ය බල ජල සූක්ෂම පද්ධති 7,231 ක් දිස්ත්‍රික් 19 ක වෙත ලබා දී තිබුණද ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල තොරතුරු අනුව පද්ධති 7,005 ක් පමණක් ලැබී තිබීම නිසා පද්ධති 226 වෙනසක් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත | වෙනස හඳුනාගෙන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල සංශෝධනය කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------- | -------------- |
| **(අ)** | 2018 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදනවලින් රු. 1,579,332 ක වැය කර ඉදිකර තිබුණු පානදුර බොජුන්හලට පිවිසීමට තරප්පු පෙළක් ඉදිකර නොතිබුණි. පසුව පානදුර ගොවිජන සේවා මධ්‍යස්ථානයේ කම්ටු අරමුදලින් රු. 197,000 ක් වැයකර තරප්පු පෙළක් ඉදිකර තිබුණද 2020 මාර්තු 31 දින වන විටත් බොජුන්හල විවෘත නොකර අභාවිතව පැවතුණි. | අදහස් දක්වා නොමැත. | අප්‍රමාදව බොජුන්හළ විවෘත කළ යුතුය. |
| **(ආ)** | ලෝක ආහාර ව්‍යාපෘතියෙන් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ CR– 0098 දරන ජීප් රථය 2015 වර්ෂයේ ලියාපදිංචිය සිදුකර භාවිතයට ගත හැකිව තිබූ නමුත් එම වර්ෂයේ සිටම මාලඹේ රථවාහන අංගනයේ ගාල් කර තිබුණි. | අදහස් දක්වා නොමැත | CR– 0098 දරන ජීප් රථය ලියාපදිංචි කර ධාවනයට ගත යුතුය. |
| **(ඇ)** | 1977 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූකාල සීමාව තුළ පොහොර ගබඩා 17 ක් අභාවිතව පැවතුණි. | අභාවිත පොහොර ගබඩා 17 සම්බන්ධ නිශ්චිත තොරතුරක් ඉදිරිපත් කිරීම සඳහා ඊට අදාළ ඇමුණුම ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි. | පොහොර ගබඩා ක්‍රියාකාරී තත්ත්වයට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ඈ)** | ගොවිජන සේවා මධ්‍යස්ථාන 21 ක රෝද ට්‍රැක්ටර් 234 ක්, රෝද 02 ට්‍රැක්ටර් 79 ක්, ට්‍රැක්ටර් ට්‍රේලර් 118 ක්, ගොයම් කපන යන්ත්‍ර 101 ක්, තැටි නඟුළු / කොකු නඟුලු 278 ක්, මඩවීල් 254 ක් සහ වෙනත් උපකරණ 1,009 ක් ආදී වත්කම් වර්ෂ 06 සිට වර්ෂ 24 ක කාලයක සිට අක්‍රියව, අභාවිතව පැවති අතර අදාළ වත්කම් අපහරණය කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු අභාවිත ට්‍රැක්ටර් හා කෘෂි යන්ත්‍රෝපකරණ අපහරණ කටයුතු සිදුවමින් පවතින අතර කොටසක් අපහරණය කර ඇත. | වත්කම් දිරාපත් වීමට ප්‍රථම අපහරණ කටයුතු සිදු කළ යුතුය. |
| **(ඉ)** | 2020 සැප්තැම්බර් 24 දින දක්වා මහව යන්ත්‍රාගාරයේ පැවති ක්‍රියාකාරී තත්ත්වයේ පවතින DAS 91, DAS 55, DAS 97 හා DAS 86 අංක දරන යන්ත්‍ර සේවයේ යොදවා නොතිබුණි. තවද 2018, 2019 වර්ෂවලද සේවයේ යෙදවීම අවම මට්ටමක පැවතුණි. 2010 වර්ෂයේදී මිලදී ගෙන තිබූ DAS 69 අංක දරන පස් තලන රෝලර් යන්ත්‍රය ගත් දින සිට සේවයේ යොදවා නොතිබුණි. | අදහස් දක්වා නොමැත | සියලුම වත්කම් පූර්ණ ලෙස උපයෝජනය කළ යුතුය. |

**3.5** **පාඩු හා හානි**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහන අනතුරු වලින් සිදු වූ රු. 29,994 ක් වූ අලාභ වටිනාකම 2020 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන තිබුණද එම ශේෂයන් මූල්‍ය ප්‍රකාශනයේ කපා නොහළ ඉදිරියට ගෙන යන ශේෂය යටතේ දක්වා තිබුණි. එම නිසා අවසාන කපා නොහළ ශේෂය රු. 29,994 ක් වැඩියෙන් දක්වා තිබුණි. පෙර වර්ෂයේද වාර්තා කළද නිවැරදි කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අදාළ ශේෂය පොත්වලින් කපා හළ යුතුය. |
| (ආ) | වාහන අනතුරු 04 කින් සිදු වූ රු. 239,221 ක් වූ අලාභ වටිනාකම 2020 ජනවාරි 01 දිනට ආරම්භක කපා නොහළ ශේෂයට ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | වරද නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | PF – 8446 අංක දරන වාහනයේ රිය අනතුරින් සිදු වූ අලාභය හානි පාඩු ලේඛනයට අනුව රු. 2,292,458 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනයේ රු. 850,000 ක් ලෙස දක්වා තිබුණි | අදහස් දක්වා නොමැත. | වරද නිවැරදි කළ යුතුය. |
| (ඈ) | PJ – 3228 අංක දරන වාහනයේ රිය අනතුරින් සිදු වූ අලාභය හානි පාඩු ලේඛනයට අනුව රු. 1,013,681 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනයේ රු. 550,000 ක් ලෙස දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | වරද නිවැරදි කළ යුතුය. |
| (ඉ) | PJ – 3238 අංක දරන වාහනයේ රිය අනතුරින් සිදු වූඅලාභය රු. 1,916,394 ක් වූ අතර රක්ෂණ සංස්ථාවෙන් ලද මුදල රු. 1,502,934 ක් විය. අය නොවූ අලාභය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අය නොවූ අලාභය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |

**3.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තු වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 61 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 78 කට 2020 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 3,475,754,381 ක් විය. | අදහස් දක්වා නොමැත | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452(1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට පසුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරිමට කටයුතු කළ යුතු අතර, එම විමසුම්වලට වහාම පිළිතුරු ලබා දීය යුතුය. එසේ පිළිතුරු ලබාදීම ප්‍රමාද විය හැකි විමසුම් වේනම් ඒ සඳහා අතුරු වාර්තාවක් යැවීමට කටයුතු කළ යුතුය. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ පාඩු හා හානි ලේඛනයේ වර්ෂ 17ක කාල සීමාවක සිට පැවත එන රු. 2,026,502 ක පරීක්ෂණ පවත්වා නිරවුල් නොකළ අලාභ ශේෂයක් පැවතුණි. | අදහස් දක්වා නොමැත. | පාඩු හා හානි සම්බන්ධව පවත්නා අසාමාන්‍ය ප්‍රමාදය වළක්වා ගැනීම සහ සිදුව ඇති අලාභය වහාම අයකර ගත යුතුය |
| (ආ) | 2014 සිට 2019 දක්වා මු.රෙ. 104 යටතේ සිදුකරන ලද පරීක්ෂණවලට අනුව නිලධාරීන් 39 කගෙන් අයවිය යුතු රු. 11,228,726 ක මුදල 2020 දෙසැම්බර් 31 දින වන විටත් අය කරගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අසාමාන්‍ය ප්‍රමාදයක් නිරීක්ෂණය වන හෙයින් නොපමාව සියලු පරීක්ෂණ අවසන් කිරීමට සැලසුම් කළ යුතුය. |
| (ඇ) | අපහරණ මණ්ඩලය මගින් අලුත්වැඩියා කර ධාවනයට යොදාගන්නා ලෙස නිර්දේශ කර තිබූ වාහන 08 ක් සම්බන්ධයෙන් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අපහරණ මණ්ඩලය මගින් ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඈ) | 2015/2016 වර්ෂවලදී ගොවීන්ගේ භාරකාර අරමුදලින් අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය සඳහා බඩඉරිඟු වගා කිරීම වෙනුවෙන් ගොවීන් 5,386 කට මාස 06 කින් අයකර ගැනීමේ පදනමින් රු. 80,790,000 ක් ලබා දී තිබුණු අතර වර්ෂ 04 ක් ගතවී තිබුණද තවදුරටත් අයවිය යුතු මුදලරු. 25,976,053 ක් විය. | අදහස් දක්වා නොමැත. | කඩිනමින් ණය අයකර ගත යුතුය. |
| (ඉ) | 2019/2020 වර්ෂවලදී ගොවීන්ගේ භාරකාර අරමුදලින් අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය සඳහා බඩඉරිඟු වගා කිරීම වෙනුවෙන් ගොවීන් 4,200 කට මාස 06 කින් අයකර ගැනීමේ පදනමින් රු. 46,200,000 ක මුදලක් ලබා දී තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විට අය නොවූ මුදල රු. 1,801,000 ක් විය. | අදහස් දක්වා නොමැත. | අඛණ්ඩව පසු විපරම් කර ණය අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සාරලංකා ණය ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර, කුරුණෑගල, පුත්තලම, කොළඹ සහ නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලවල ගොවීන් 33 කට ලබා දී තිබූ රු. 14,800,000 ක ණය මුදලින් රු. 11,285,972 ක් තවදුරටත් අයවිය යුතු අතර මෙම ණය අයවීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවතුණි. මෙම ව්‍යාපෘතිය මගින් කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම අරමුණු වුවත් 2020 වර්ෂය වන විට ණය ලබාදුන් ගොවීන් 286 න් 36 ක් අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකරන අතර ගොවීන් 27 ක් මාසිකව නිෂ්පාදනය කරන පොහොර ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 400 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | අදහස් දක්වා නොමැත. | අඛණ්ඩව පසු විපරම් කර ණය අයකර ගත යුතුය. |
| (උ) | 2018 ජනවාරි 01 දින අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලයේ වටරැක්කාව කෘෂි මාර්ගය ඉදිකිරීම සඳහා ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලද රු. 280,000 ක මුදල වර්ෂ 02 ක කාලයක් තුළ එම කෘෂි මාර්ගයේ සංවර්ධන කටයුතු ආරම්භ නොකිරීම හේතුවෙන්, 2020 ජූලි 13 දින සහ 2020 අගෝස්තු 24 දින ගොවීන්ගේ භාරකාර අරමුදල වෙත ආපසු යවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ ආයතන විසින් ලබා දුන් ප්‍රතිපාදන වර්ෂය තුළ උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 267 ක ඇඟිලි සලකුණු යන්ත්‍ර සවිකර තිබූ අතර ඉන් යන්ත්‍ර 30 ක් අක්‍රීයව පැවතුණි. ගොවිජන සේවා මධ්‍යස්ථාන 71 ක ඇඟිලි සලකුණු යන්ත්‍ර යොදා තිබුණද තාක්ෂණික ගැටළු නිසා ප්‍රධාන කාර්යාලය අපේක්ෂා කළ වාර්තා ලබා ගැනීමට නොහැකි වී තිබුණි. කොළඹ හා හම්බන්තොට ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල 02 විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ඇඟිලි සළකුණු යන්ත්‍ර සවිකර ඒවා මගින් පැමිණීම සහ පිටවීම වාර්තා කළ යුතුය. ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා කළ යුතු සියලුම වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කළ යුතුය |
| (එ) | දිස්ත්‍රික් කාර්යාල 16 ක ගොවි බැංකු මගින් ලබා දී ඇති වර්ෂ 6 සිට 20 දක්වා කාලයක සිට පැවත එන රු. 286,664,393 ක අය නොවන ගොවි ණය ශේෂයන් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ප්‍රමාද වූ ණය මුදල් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ඒ)** | ගොවිජන සේවා මධ්‍යස්ථාන 413 ක 2019 දෙසැම්බර් 31 දිනට සකස් කළ මූල්‍ය ප්‍රකාශන අනුව දීර්ඝ කාලයක සිට පැවත එන රු. 527,262,332 ක වටිනාකමැති අයවිය යුතු සේවක ණය, කෘෂිකාර්මික භාණ්ඩ ණය, ව්‍යාපෘති ණය යනාදී ශේෂ 4,366 ක් පැවතුණි. යථෝක්ත ණය ශේෂ අය කරගැනීමට දිස්ත්‍රික් කාර්යාල හා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ණයගැති ශේෂ නොපමාව අයකර ගත යුතුය. |
| **(ඔ)** | රත්නපුර දිස්ත්‍රික් කාර්යාලයේ සේවය කරන ගොවිජන සංවර්ධන නිලධාරීන් 14 දෙනෙකු, ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරුවන් 05 දෙනෙකු සහ කාර්මික නිලධාරීයෙකු වර්ෂ 10 කට වැඩි කාලයක් එකම ස්ථානයේ සේවය සඳහා යොදවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | දිර්ඝ කාලයක් එකම ස්ථානයක සේවයේ යෙදවීම නොකළ යුතුය. |

**4. යහපාලනය**

--------------

**4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

---------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව වෙත ජනාධිපති කාර්යාලයෙන්, අග්‍රාමාත්‍ය කාර්යාලයෙන්, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් සහ “ජනපතිට කියන්න” වැඩසටහන මගින් පැමිණිලි 473 ක් යොමු වී තිබූ අතර එයින් පැමිණිලි 291 ක් සඳහා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද 2017, 2018, 2019 වර්ෂවලදී දිස්ත්‍රික් කාර්යාල වෙත යොමු කළ පැමිණිලි 1,226 ක වර්තමාන තත්ත්වය ප්‍රධාන කාර්යාලය වෙත ලබාගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | පැමිණිලි විභාග කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතුය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන සැලැස්මේ ඇතුළත් වූ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ලැබීම් හා ගෙවීම් පරීක්ෂාව, ප්‍රධාන කාර්යාලයේ හා සංවර්ධන කටයුතුවල ප්‍රසම්පාදන පරීක්ෂාව හා අලුත්වැඩියා, වැව් හා වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු, ගොවිජන සංවර්ධන අරමුදලේ ලැබීම් හා ගෙවීම් පරීක්ෂාව, මධ්‍යස්ථාන අවසාන ගිණුම් යනාදී අරමුණු 2019 වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂය තුළ ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුළත් කළ කාර්යයන් ඉටු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2020 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව 3,700ක් වූ අතර පුරප්පාඩු තනතුරු 12 ක් සඳහා අනුමත සේවක සංඛ්‍යාවෙන් එක් සේවකයෙකුවත් බඳවාගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | කොමසාරිස් (පරිපාලන හා මානව සම්පත්), කොමසාරිස් (සේවා) සහ 2020 ඔක්තෝබර් මාසයේ විශ්‍රාම යාමට නියමිත කොමසාරිස් (සංවර්ධන) තනතුරු ඇතුළු අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවිය යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තු බඳවා ගැනීමේ පරිපාටිය අනුව කොමසාරිස් තනතුරුවලට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් පත්කළ යුතු වුවද කොමසාරිස් සේවා, පරිපාලන හා මානව සම්පත් තනතුරු සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් වැඩ බැලීම සහ රාජකාරී ඉටු කිරීම සඳහා පත්කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දිවයින පුරා ගොවි බැංකු 559 ක් වූ අතර ගොවි බැංකු නිලධාරීන් සහ සහකාර ගොවි බැංකු නිලධාරීන් ඇතුළු සියළු තනතුරු පුරප්පාඩුව පැවතුණි. ගොවි බැංකු කටයුතු සඳහා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවන් යොදවා තිබුණු අතර එම හේතුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථානවල වසම් කීපයකට එක් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවකු බැගින් යොදවා තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කර කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් වසම්වලට අනුයුක්ත කළ යුතු වීම. |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලවල සේවය කරන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන නොවීම නිසා සේවය ස්ථිර කිරීම, වැටුප් වර්ධක, වාර්ෂික උසස්වීම් ආදී කටයුතු ප්‍රමාද වී ඇති නිලධාරීන්ගේ විශ්‍රාම යාම ආදී කටයුතු සඳහා මෙම තත්ත්වය අහිතකර ලෙස බලපා තිබුණි. | අදහස් දක්වා නොමැත. | පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කළ යුතුය. |
| (ඉ) | 2020 වර්ෂයේ වැඩ බලන පත්වීම් 23 ක් ලබා දී තිබුණු අතර එයින් ගොවිජන සංවර්ධන නිලධාරී පුරප්පාඩු 14 ක් විය. ඉන් පුරප්පාඩු 06 ක් වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවති අතර අදාළ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | 2019 ඔක්තෝබර් 10 දිනැති අංක 3/2019 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාල චක්‍රලේඛයේ 5 ඡේදයේ xiv වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ පූර්ණ අනුමැතිය මත මිස ඉදිරියේදී අනුමැතිය ලබාගැනීමේ අපේක්ෂාවෙන් කිසිදු විශ්‍රාමිකයකු සේවයේ යෙදිය නොහැකි බව සඳහන්කර තිබුණි. එම විධිවිධානයට පටහැනිව කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව නිලධාරීන් 18 ක් සේවයේ යොදවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ දී ආවරණ අනුමැතියට යටත්ව පත්කළ නිලධාරීන් 04 කට වැටුප් ලෙස රු. 1,786,726 ක ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |